# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021
2024 නොවැම්බර් / දෙසැම්බර්

**සමාජීය විද්‍යා පීඨය**

**භූගෝල විද්‍යාව**
**(අධ්‍යයන වර්ෂ 2007 සිට 2016 දක්වා)**

**මානුෂ භූගෝල විද්‍යාවට හැඳින්වීමක් GEOG - E1025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. මානුෂ භූගෝලවිද්‍යා විෂය පථයට අයත් උප-විෂය ක්ෂේත්‍රයන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. "මානුෂ භූගෝල විද්‍යාව යනු අස්ථාවර පෘථිවිය හා අවිවේකී මිනිසා අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීමයි" එලන් චර්චිල් සෙම්පල් (Ellen C. Semple) ගේ මෙම ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 20)

03. මානව ක්‍රියාකාරකම්වල විවිධතා අධ්‍යයනය කිරීමට 'අවකාශය' නමැති සංකල්පය කොතරම් වැදගත් නිර්ණායකයක් වන්නේද යන්න පරීක්ෂා කරන්න. (ලකුණු 20)

04. i. 'මානව ජනාවාස' නිර්වචනය කරන්න. (ලකුණු 03)

    ii. ජනාවාස වර්ගීකරණ සඳහා යොදාගන්නා නිර්ණායක 05 ක් දක්වන්න. (ලකුණු 05)

    iii. සංවර්ධනය වන රටවල උප- නාගරික ජනාවාසවල මෑතකාලීන කැපී පෙනෙන ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 12)

05. 'ජන සංක්‍රාන්ති න්‍යාය ජනවිද්‍යාත්මක විචලන අනුව ගොඩනගන ලද න්‍යායාත්මක ආකෘතියකි.' විමසන්න. (ලකුණු 20)

06. ගෝලීය සංවර්ධනයේ අවකාශීය විෂමතා කෙරෙහි බලපා ඇති මානව භූගෝලීය සාධක මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 20)

07. මානව-පරිසර සම්බන්ධතාවයේ තිරසර පැවැත්ම උදෙසා සම්පත් සංරක්ෂණයෙහි ඇති වැදගත්කම ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

08. පහත මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ඉදිරිපත් කරන්න.

    i. ප්‍රධාන මානව වර්ග
    ii. ආර්ථික කටයුතු වර්ගීකරණය
    iii. ග්‍රාමීය - නාගරික සංක්‍රමණ
    iv. ගෝලීය සංවර්ධන ගැටලු (ලකුණු 10x2=20)

*********************************